කාගිල්ස් ඔන්ලයින් LANKAQR සමඟ එක් වූ පළමු e-commerce සේවාව බවට පත්වේ

2021 දෙසැම්බර් 15 - කොළඹ කාගිල්ස් ඔන්ලයින් සිය පාරිභෝගිකයන්ට ලබාදෙන සේවා පහසුකම් වඩාත් වැඩිදියුණු කරමින් ගෙවීම් සඳහා LANKAQR සමඟ එක්වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ දැනට පවතින එකම ඉලෙක්ට්‍රොනික වාණිජ වේදිකාව බවට පත්ව වෙයි. LANKAQR යනු ශ්‍රී ලංකාවේ සියලුම QR කේත සහ QR කේත පදනම් කරගත් ගනුදෙනු ප්‍රමිතිගත සහ අන්තර් ක්‍රියාකාරී බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දියත් කරන ලද ව්‍යාපෘතියකි.

කෙතරම් අවස්ථාවන් ගණනක් අපි අන්තර්ජාලයෙන් ඇණවුම් කරන සිල්ලර වෙළෙඳ භාණ්ඩ අපිට නොලැබී තිබෙනවාද මෙම ගැටලුව විසඳීම සඳහා කාගිල්ස් ඔන්ලයින් dark store සංකල්පය හඳුන්වා දෙමින් ශ්‍රී ලංකාවේ සිල්ලර වෙළෙඳ භාණ්ඩ සැපැයුම් දාමයේ විප්ලවීය වෙනසක් ඇති කරන ලදී. කාගිල්ස් ඔන්ලයින් විසින් නැවුම් නිෂ්පාදන පෙළක් පිරිනමන අතර පාරිභෝගිකයන්ට අවශ්‍ය සිල්ලර භාණ්ඩ මිනිත්තු 2කට අඩු කාලයකින් පහසුවෙන් ඇණවුම් කර කිසිදු අපහසුතාවකින් තොරව ගෙන්වා ගැනීමේ හැකියාව පවතී. පළපුරුදු බෙදාහැරීමේ නියෝජිතයන් භාණ්ඩ බෙදාහැරීමේ කාර්යය ඉතාමත් කාර්යසාධකව සිදු කරනු ලැබේ. සෑම විටම පාරිභෝගිකයන්ට ඉහළම සේවාවක් ලබාදීමට පාරිභෝගික සේවා කණ්ඩායම කටයුතු කරයි. LANKAQR සේවා පහසුකමට අමතරව භාණ්ඩ ලැබුණු පසු මුදල් හෝ කාඩ්පත් මඟින් ගෙවීමේ පහසුකම සහ ඔන්ලයින් ක්‍රමයට. ගෙවීමේ පහසුකමද කාගිල්ස් ඔන්ලයින් විසින් සලස්වාදී තිබේ. කාගිල්ස් ඔන්ලයින් වෙත ඇන්ඩ්‍රොයිඩ් සහ iOS දුරකථනයන්හි ඇති යෙදුම් (app) හරහා සහ https://cargillsonline.com/ වෙබ් අඩවිය හරහා ප්‍රවේශ විය හැකිය. පාරිභෝගිකයන්ට ජංගම දුරකථන යෙදුම් භාවිත කර හෝ වෙබ් අඩවියට පිවිස ගෙවීම් ක්‍රමය ලෙස LANKAQR තෝරාගත හැකිය. කාගිල්ස් කණ්ඩායම ඇණවුම ලබාදෙන අවස්ථාවේදී පාරිභෝගිකයන්ට LANKAQR භාවිතයෙන් ගෙවීම් කිරීමට ඕනෑම ගෙවීමේ යෙදුමක් (payment app) භාවිත කළ හැකිය. ගෙවීම් ක්‍රමය ලෙස Card On Delivery හෝ Cash On Delivery තෝරාගෙන තිබුණත් භාණ්ඩ ලැබුණු පසු පාරිභෝගිකයන්ට LANKAQR හරහා ගෙවීමේ පහසුකම පවතී.

මේ සම්බන්ධයෙන් සිය අදහස් දක්වමින් යෞවන හා ක්‍රීඩා අමාත්‍ය සංවර්ධන සම්බන්ධීකරණ සහ අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කරන ලද්දේ "මේ වන විට අප සිටින්නේ නවීන තාක්ෂණය යොදා ගනිමින් ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතය වැඩි කර ආර්ථිකය ශක්තිමත් කර සමෘද්ධිය කරා ගෙන යෑමට උත්සාහ දරන විප්ලවීය අවධියක. මෙම ජාතික ප්‍රයත්නයට අපට සහාය වීමට කාගිල්ස් සිලෝන් ආයතනය ඉදිරිපත් වීම ගැන මම සතුටට පත් වෙනවා. LANKAQR යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ LankaClear හි සහයෝගය ඇතිව අප විසින් ගොඩනැඟූ සංකල්පයක් මෙහි විශේෂත්වය වන්නේ LANKAQR සම්පූර්ණයෙන්ම ගොඩනඟා තිබෙන්නේ ශ්‍රී ලාංකික විශේෂඥයන්ගේ දැනුම උපයෝගී කරගෙන වීමයි."

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති අජිත් නිවාඩ් කබ්‍රාල් මහතා අදහස් දක්වමින් "ශ්‍රී ලංකා මහ බැංකුව LankaClear සමඟ එක්වී LANKAQR හඳුන්වා දෙන ලද්දේ ශ්‍රී ලංකාව මුදල් නෝට්ටු භාවිතය අවම කරන සමාජයක් බවට පත් කිරීම සඳහායි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් රටේ සංවර්ධනයේ උත්පාදකයන් වන අතර ඔවුන්ගේ උපරිම සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සියලු සම්පත් සහ සහයෝගය ඔවුන්ට ලබාදීම අපට වැදගත් වේ. මෙම තාක්ෂණය දිවයින පුරා විසිරී සිටින විශාල පාරිභෝගික පිරිසක් වෙත ගෙන යෑමට අප සමඟ අත්වැල් බැඳගත් කාගිල්ස් සිලෝන් ආයතනයට මම ස්තුතිවන්ත වෙනවා."

කාගිල්ස් ෆුඩ්ස් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ්හි කළමනාකාර අධ්‍යක්ෂ අශෝක පීරිස් මහතා සිය අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ "ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන රටාව වැඩිදියුණු කිරීම සඳහා කාගිල්ස්හි අඛණ්ඩ කැපවීම හේතුවෙන් අපි කාගිල්ස් ඔන්ලයින් හඳුන්වා දෙනු ලැබුවා. මෙම හඳුන්වාදීම තුළින් පාරිභෝගිකයන්ට නිවෙසේ සිටම අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමින් සුපිරි වෙළෙඳසළක අත්දැකීම ලබා ගැනීමට හැකි වූවා. LANKAQR සමඟ එක් වීමෙන් අපගේ පාරිභෝගිකයන්ට ඔවුන්ගේ භාණ්ඩ සඳහා ගෙවීම් සිදු කිරීම වඩාත් පහසු වනු ඇත. බෙදාහැරීම සඳහා LANKAQR සමඟ එක්වූ ශ්‍රී ලංකාවේ පළමු සහ දැනට එකම ඉලෙක්ට්‍රොනික වාණිජ වේදිකාව වීම ගැන අපි ආඩම්බර වනවා."

ශ්‍රී ලංකාව මුදල් නෝට්ටු භාවිතය අවම කරන සමාජයක් බවට පත් කිරීමට සහ රට පුරා මූල්‍ය අන්තර්ගතය වැඩි කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව LankaClear ආයතන සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන සමඟ එක්ව LANKAQR හඳුන්වා දෙන ලදී. LANKAQR මඟින් පාරිභෝගිකයන්ට ඔවුන්ගේ බැංකු ගිණුම්වලින් සෘජුවම LANKAQR සහතිකලත් මූල්‍ය ආයතනවල ගෙවීම් යෙදුම් (payment app) භාවිත කරමින් වෙළෙඳුන් හෝ සේවා සපයන්නන්ගේ ගිණුම් වෙත ගෙවීම් කිරීමට ඉඩ සලසයි. LANKAQR යනු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මූලික වශයෙන් ඉලක්ක කරගත් අඩු වියදම් ඩිජිටල් ගෙවීම් විසඳුමකි.

එරික් රාජපක්ෂ දෘෂ්ටි විශේෂඥයෝ සිය ශාඛා ජාලය පුළුල් කරමින් මාලඹේ නගරයට පිවිසෙයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දෘෂ්ටි සේවා සපයන්නකු වූ එරික් රාජපක්ෂ දෘෂ්ටි විශේෂඥ ආයතනය, සිය වසර 100 යක් ඉක්ම වූ දැක්ම වඩාත් පුළුල් කරමින් නවතම ශාඛාවක් පසුගියදා මාලඹේ නගරයේදී විවෘත කරන ලදී. අංක 888, අතුරුගිරිය පාර, මාලඹේ දරන ස්ථානයේ පිහිටි මෙම නව ශාඛාව චාරිත්‍රානුකූලව විවෘත කරන ලද්දේ එරික් රාජපක්ෂ දෘෂ්ටි විශේෂඥ ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂ රජිව් රාජපක්ෂ විසිනි.

නවීන පහසුකම් රැසකින් සමන්විත මෙම ශාඛාව හරහා, මාලඹේ ප්‍රදේශයේත් ඒ අවටත් සිටිනා සියලුම පාරිභෝගිකයන් හට අඟනා සේවාවක් සැපයීමට එරික් රාජපක්ෂ දෘෂ්ටි විශේෂඥ ආයතනය සූදානමින් සිටී. එරික් රාජපක්ෂ දෘෂ්ටි විශේෂඥ ආයතනයේ සියලුම ප්‍රදර්ශනාගාර මනා වෘත්තීයමය පුහුණුවක් ලැබූ සේවක මඩුල්ලකින් සමන්විත වන අතර, සෑම වයස් කාණ්ඩයකම පාරිභෝගිකයන් සඳහා උසස් වර්ගයේ අක්ෂි හා ශ්‍රවණ නිපැයුම් ඉතාමත් සාධාරණ මිල ගණන් යටතේ ලබා ගැනීමේ හැකියාව පවතී. මෙම නවීන ප්‍රදර්ශනාගාරයදී Michael Kors, Prada, Gucci, Vogue, Ray Ban ,Polo Ralph, Lauren, Polar Sun වැනි ජාත්‍යන්තර සන්නාමයන්ගේ ඇස් කණ්ණාඩි සහ අව් කණ්ණාඩි මාදිලි රැසක්ම තෝරා ගැනීමේ හැකියාව පාරිභෝගිකයන් හට පවතී. තත්ත්වයෙන් ඉතාමත් උසස් ප්‍රංශයේ එසිලර් කාව ඇතුළු විවිධ වර්ගයේ ඇස් කණ්ණාඩි කාවද මෙහිදී ලබාගැනීමේ හැකියාව තිබේ. තවද අක්ෂි පරීක්ෂණ සඳහා උපයෝගී කර ගැනෙනා උසස්ම තාක්ෂණයේ යන්ත්‍රෝපකරණයන්ගෙන්ද මෙම ශාඛාව සමන්විත වෙයි. මෙහිදී ඔබට ඩෙන්මාකයේ නිෂ්පාදිත ලොව ප්‍රචලිත Beltone ශ්‍රවණාධාර ඉතාම සාධාරණ මිලකට මිලදී ගැනීමේ අවස්ථාව හිමිවේ.

HNB FINANCE PLC හි මෙහෙවර සමාජ වගකීම් ප්‍රවේශය මඟින් දෘශ්‍යාබාධිත පවුල් 100ක් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය පරිත්‍යාග කරයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සමාගමක් වන HNB FINANCE PLC ප්‍රධානතම ආයතනික සමාජ සත්කාරක ප්‍රවේශය වන මෙහෙවර වැඩසටහන ඔස්සේ සීදුව ප්‍රදේශයේ ජීවත් වන දෘශ්‍යාබාධිත පවුල් 100ක් සඳහා වියළි ආහාර බෙදා දීම පසුගියදා සිදු කෙරිණි.

පසුගිය දෙසැම්බර් 23 වැනි දින පැවති මෙම වියළි ආහාර ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ අවස්ථාවට HNB FINANCE හි ප්‍රධාන මානව සම්පත් නිලධාරි සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් සහ පරිපාලන රුවන් ප්‍රනාන්දු පුහුණු අංශ ප්‍රධානි අනුර උඩවත්ත, පුහුණු අංශ කළමනාකාර සංජේ සේනාසිංහ සහ නුවන් කුමාර යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.සේවකයන්ගේ සහ සමාගමේ ස්වේච්ඡා අරමුදල් දායකත්වයෙන් ගොඩනංවනු ලැබූ මෙහෙවර ආයතනික සමාජ වගකීම් ප්‍රවේශය විවිධ ප්‍රජා සුබසාධන වැඩසටහන් සිදු කරමින් සරණක් අවැසි පුද්ගලයන් වෙත සිය දායකත්වය නොපැකිලිව ලබාදීමට කටයුතු කර ඇත.

TVS මෝටර් සමාගම සහ BMW Motorrad අතර සහයෝගිතා ගිවිසුම දීර්ඝ කිරීම නිවේදනය කරයි

TVS මෝටර් සමාගම සහ BMW Motorrad ඔවුන්ගේ දිගුකාලීන හවුල්කාරිත්වය දීර්ඝ කරමින් සහ පුළුල් කරමින් නව ව්‍යාපාරික අවස්ථා සහ විදුලි වාහන ඇතුළු අනාගත තාක්ෂණයන් ඒකාබද්ධව සංවර්ධනය කිරීමට කටයුතු කරන බව පසුගියදා නිවේදනය කළේය. මෙමඟින් අනාගත BMW Motorrad නිෂ්පාදන සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතිය පවත්වා ගැනීම, සැපයුම් දාම (Supply - Chain) කළමනාකරණය සහ කාර්මික සහාය ලබාදීම TVS මෝටර් සමාගමේ විෂය පථය තුළට ඇතුළත් කිරීම සිදු කෙරේ. මෙම පුළුල් සහ දියුණු කරන ලද සහයෝගිතාව යටතේ, සමාගම් දෙකම සැලකිය යුතු ව්‍යාපාරික ප්‍රතිලාභයක් ලබාගැනීම සඳහා නිෂ්පාදන සහ තාක්ෂණ ක්‍රම පරාසයක් හඳුනාගෙන ඇත.

BMW Motorrad සහ TVS මෝටර් සමාගම විවිධ ජාත්‍යන්තර වෙළෙඳපොළ වල පාරිභෝගික කාණ්ඩවල අවශ්‍යතා අනුව අනාගත රථවාහන ක්ෂේත්‍රයේ නැඟී එන තාක්ෂණයන් ගවේෂණය කරමින් සංවර්ධනය කරනු ඇත. සමාගම් දෙක සඳහාම සුවිශේෂී නිෂ්පාදන මෙම පොදු සහයෝගිතාවන් මත සංවර්ධනය කරනු ලබන අතර ඔවුන් එකිනෙකා තම තමන්ගේ නිෂ්පාදන ගෝලීය වෙළෙඳපොළට නිකුත් කරනු ඇත. නිර්මාණාත්මක හැකියාව, නිෂ්පාදන සහ සැපයුම්දාම යන අංශවල සිය තාක්ෂණික කුසලතාවන් තුළින් එළිදකින විශිෂ්ටතම නිෂ්පාදන හරහා අන් තරගකරුවන් අභිභවීමට සහ සුවිශේෂී ආර්ථික වාසි ලබාගැනීම සඳහා TVS මෝටර් සමාගම අඛණ්ඩව ක්‍රියාකරනු ඇත. මෙම සහයෝගිතාව හරහා එළිදක්වන පළමු නිෂ්පාදනය ඉදිරි මාස 24 තුළ පාරිභෝගිකයන්ට දැක ගැනීමට හැකිවනු ඇත.

TVS මෝටර් සමාගම කීර්තිමත් යතුරුපැදි සහ ත්‍රිරෝද රථ නිෂ්පාදකයකු වන අතර එය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.5ක වත්කමක් ඇති TVS ව්‍යාපාර සමූහයේ ප්‍රමුඛතම සමාගම වන අතර ලෝකය පුරා රටවල් 70කට අධික සංඛ්‍යාවක ව්‍යාප්තව පවතී. මේ අතර, BMW ව්‍යාපාර සමූහය එහි BMW, MINI, Rolls-Royce සහ BMW Motorrad යන සන්නාම හතර ඔස්සේ මෝටර් රථ සහ යතුරුපැදි නිෂ්පාදනය කරන ලොව ප්‍රමුඛතම සුඛෝපභෝගී මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් රටේ සංවර්ධනයේ උත්පාදකයන් වන අතර ඔවුන්ගේ උපරිම සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සියලු සම්පත් සහ සහයෝගය ඔවුන්ට ලබාදීම අපට වැදගත් වේ. මෙම තාක්ෂණය දිවයින පුරා විසිරී සිටින විශාල පාරිභෝගික පිරිසක් වෙත ගෙන යෑමට අප සමඟ අත්වැල් බැඳගත් කාගිල්ස් සිලෝන් ආයතනයට මම ස්තුතිවන්ත වෙනවා."

කාගිල්ස් ෆුඩ්ස් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ්හි කළමනාකාර අධ්‍යක්ෂ අශෝක පීරිස් මහතා සිය අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ "ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන රටාව

සුදර්ශන් වේනු මහතා, සම කළමනාකාර අධ්‍යක්ෂ, TVS මෝටර් සමාගම, ඉන්දියාව

අධි මිල වාහන නිෂ්පාදකයා වේ. BMW ව්‍යාපාර සමූහයේ නිෂ්පාදන ජාලය රටවල් 15ක් පුරා විහිදුණු නිෂ්පාදන සහ එකලස් කිරීමේ කම්හල් 31කින් සමන්විත වේ. මෙම සහයෝගිතා ගිවිසුම ආයතන දෙකටම වාසිදායක වේ.

TVS මෝටර් සමාගමේ සම කළමනාකාර අධ්‍යක්ෂ සුදර්ශන් වේනු මහතා පැවසුවේ, BMW Motorrad සමඟ පසුගිය වසර නවය තුළ පැවැති අපගේ උපායමාර්ගික සහයෝගිතාව තුළ අපි ගුණාත්මකභාවය, තාක්ෂණික ශ්‍රේෂ්ඨත්වය, නවෝත්පාදනය සහ පාරිභෝගික තෘප්තිය යන සියලු කාරණා කෙරෙහි අපේ අවධානය යොමු කළෙමු. මෙම කරුණු සහ උසස් තත්ත්වයේ නිෂ්පාදන ඉදිරිපත් කිරීම තුළින් පාරිභෝගිකයන්ට සුවිශේෂී වටිනාකමක් ලබාදීමට අප තුළ පවතින දැඩි කැපවීම අප ඉදිරිපත් කළ නිෂ්පාදන තුනෙහිම සාර්ථකත්වයට ප්‍රබලම සාධක ලෙස සැලකිය හැකිය. අනාගතයේදී ලොවම විදුලි බලයෙන් දුවන වාහන ඇතුළු විකල්ප විසඳුම් සඳහා වැඩි වශයෙන් යොමු වන පසුබිමක් තුළ මෙම සාර්ථක හවුල්කාරිත්වය විදුලි බලයෙන් ක්‍රියාත්මක වාහන සහ අනෙකුත් නව ව්‍යාපාර අවස්ථා වෙත ව්‍යාප්ත කිරීමෙන් ගෝලීය වෙළෙඳපොළ වෙත උසස් තාක්ෂණය සහ වැඩි ඉල්ලුමක් ඇති නිෂ්පාදන ලබාදීමට සහ සමාගම් දෙකටම වැඩි වටිනාකමක් ගෙන ඒමට අවස්ථා නිර්මාණය වනු ඇත" යනුවෙනි.

Motorradහි ප්‍රධානී Dr. Markus Schramm මහතා පැවැසුවේ, "TVS මෝටර් සමාගම සමඟ පැවැති අපගේ ඵලදායී හවුල්කාරිත්වය මත පදනම්ව, නව ව්‍යාපාර අවස්ථා සහ තාක්ෂණයන් ඒකාබද්ධව සංවර්ධනය කිරීම සඳහා අපගේ සහයෝගිතා ගිවිසුම දීර්ඝ කිරීමට සහ පුළුල් කිරීමට හැකි වීම ගැන අපි සතුටු වෙනවා. අපගේ ශක්තිමත් සහයෝගිතාවන් නිසා Sub -500cc කාණ්ඩයේ ආකර්ෂණීය නිෂ්පාදන ඉදිරිපත් කිරීමට හැකි වූ අතර BMW G 310 R සහ BMW G 310 GS තනි සිලින්ඩර මාදිලි යතුරුපැදි හඳුන්වා දීමේ සිට ලෝකය පුරා 100,000කට අධික පාරිභෝගිකයන් පිරිසක් සමඟ අසමසම ජනප්‍රියත්වයක් අත් කරගෙන සිටියි. මෙම සහයෝගිතාව තුළින් ඉතා යහපත් අනාගත අවස්ථාවන් රැසක් අපි බලාපොරොත්තු වෙමු" යනුවෙනි.

2013 අප්‍රේල් මාසයේදී TVS Motor Company සහ BMW Motorrad 500cc ධාරිතා කාණ්ඩයේ යතුරුපැදි නිෂ්පාදනය කිරීම සඳහා දිගුකාලීන උපායමාර්ගික හවුල්කාරිත්වයකට එළැඹෙන ලදී. මෙම සහයෝගිතාව ඔස්සේ BMW G 310 R" BMW 310 GS සහ TVS මෝටර් සමාගමේ TVS Apache RR 310 යනුවෙන් 310cc ධාරිතා කාණ්ඩයේ යතුරුපැදි තුනක් නිපදවා ඇත. මෙම නිෂ්පාදන යුරෝපා සංගමය, ඇමෙරිකාව, ජපානය, චීනය සහ ඉන්දියාව වැනි ලොව සියලුම ප්‍රමුඛ වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයන් 100,000කට අධික සංඛ්‍යාවක් දිනාගෙන ඉහළ පාරිභෝගික ප්‍රසාදයක් හිමිකරගෙන සිටියි. මෙම සාර්ථකත්වයේ අඩිතාලම වන්නේ ආයතන දෙක ඇතිකරගත් මෙම සහයෝගිතාවයි.

TVS යනු කීර්තිමත් වාහන සන්නාමයක් වන අතර එය නව්‍ය, විශ්වසනීය සහ ප්‍රවේගවත් මෝටර් සයිකල් සහ ස්කූටර රැසක් නිපදවනු ලබයි. පාරිභෝගික කැමැත්ත අනුව විවිධ වර්ණ, කාර්යක්ෂමතා සහ දිගු දුරක් ධාවනය කළ හැකි පරිදි නව්‍ය සහ විශ්වසනීය යතුරුපැදි මාදිලි රැසක්ම ආයතනය මඟින් නිපදවා බෙදා හරිනු ලබයි. TVS Lanka ^Pvt& Limited යනු TVS යතුරුපැදි සහ අමතර කොටස් සඳහා ශ්‍රී ලංකාවේ එකම බෙදාහරින්නා වේ. TVS Lanka විසින් දිවයින පුරා විහිදුණු සේවා ජාලය මෙන්ම අමතර කොටස් පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව නිසා පාරිභෝගිකයන්ට විශිෂ්ට සේවාවක් සපයයි.

Scanned with CamScanner